1756

# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මුරපොල ඇල
## வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் - முரபொலஎல
## Resident Project Management Office – Murapola Ela


වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

නීලවල
කොළඹිස්ස
நீலவல
கொலம்பிஸ்ஸ
Neelawala
Kolambissa


08 APR 2019

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No – 36/3/4 | ඔබේ අංකය / உமது இல. / Your Ref No – | දිනය / திகதி / Date – 2019.03.11 |

**1994 අංක 13 දරණ වාරිමාර්ග ආඥා පනතින් සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ සඳහන් විධිවිධාන යටතේ මුරපොල ඇල මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2018 යල කන්නය සඳහා පවත්වනු ලබන පෙර වගා රැස්වීම .**

දිනය :- 2019/03/11 දින පෙ.ව 10.30
ස්ථානය :- මුරපොල ඇල නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යයාලය
මුලසුන :- නේවාසික ව්‍යාපාර කළමනාකරු
සහභාගීත්වය :- රේඛීය ආයතන හා ගොවි සංවිධාන

රජයේ නිලධාරීන්ගේ සහභාගිත්වය

- එම්.ජී.ඩී.බණ්ඩාර මයා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
- ජී.පී.ඩී.එස්.අමරසූරිය මිය - ආයතන සං.නිලධාරී - මුරපොල ඇල
- එච්.එම්.ජී.එම් හේරත් මිය - ඉ.සහකාර - මුරපොල ඇල
- ඩබ්.එම්.එන්.කේ.අරම්බෙපොල මිය - ගො.වි.ප්‍රා.නි (මාරස්සන)
- එච්.එම්.සී.බී.හේරත් මයා - කෘ.උපදේශක - මාරස්සන
- ඩී.එම්.ආර්.පී.කුමාර මයා - සං.නිලධාරී - මුරපොල ඇල
- එච්.එස්.පී.කුමාරි මිය - සං.නිලධාරී - මුරපොල ඇල
- ඩබ්.එම්.සී.මිහිර බණ්ඩාර මයා -සං.නිලධාරී(කෘෂිකර්ම) කලාතුඔය
- ඩබ්.එම්.සී.වීරසිංහ මිය - කෘ.ප.නි.ස. මාරස්සන
- එච්.කේ.ජී.ආර්.මල්කාන්ති මිය - කෘ.ප.නි.ස. මාරස්සන
- තමරා කුලසේකර මිය - කෘ.ප.නි.ස. මාරස්සන
- පී.ජී.විජේරත්න බණ්ඩා මයා - කෘ.ප.නි.ස. මාරස්සන

ගොවි නියෝජිතයින්ගේ සහභාගිත්වය

- ඕ.ජී කුඩාබන්ඩා මයා නවනැලිය ගොවි සංවිධානය -ගරු ලේකම්
- ඩබ්ලිව්.එම්.විරසිංහ මයා කොටගේපිටිය ගොවි සංවිධානය - ගරු ලේකම්
- ඕ.ජී ජයවීර මයා කොටගේපිටිය ගොවි සංවිධානය - ගරු භාණ්ඩාගාරික
- ඩබ්ලිව්.එම් ඩයාබන්ඩා මයා කොටගේපිටිය ගොවි සංවිධානය- ගරු සභාපති
- එම්.ජී රනතුංග මයා ගිරාඹෙ ගොවි සංවිධානය-ගරු සභාපති
- එස්.ඩී.ජී සුගතපාල මයා ගිරාඹෙ ගොවි සංවිධානය-ගරු ලේකම්
- එස්.එම් සෝමාවතී මිය ගිරාඹෙ ගොවි සංවිධානය - ගරු භාන්ඩාගාරික
- අයි.ජේ.එම් ජයසේකර මයා වටපඳුර ගොවි සංවිධානය -ගරු භාණ්ඩාගාරික
- කේ.එම්.ටිකිරි බණ්ඩා මයා වටපඳුර ගොවි සංවිධානය -ගරු සභාපති
- ජේ.එම් කැඑම් ජයසේකර මයා මකුලයට තැන්න ගොවි සංවිධානය-ගරු භාණ්ඩාගාරික
- ආර්.ජී.පී. විජේනාරායන මයා නීලවල ගොවි සංවිධානය - ගරු සභාපති
- ටී.ජී ජයරත්න මයා නීලවල ගොවි සංවිධානය-ගරු භාණ්ඩාගාරික
- ආර්.බී කොළඹගල මයා නීලවල ගොවි සංවිධානය-ගරු ලේකම්

- ආර්.එම් සුමනරත්න බන්ඩා මයා — කහඹිලියාව ගොවි සංවිධානය -ගරු සභාපති
- බී.පී දයාවතී මිය — කහඹිලියාව ගොවි සංවිධානය-ගරුලේකම්
- කේ.ජී.එම් වික්‍රමරත්න මයා — ගුරුබැද්ද ගොවි සංවිධානය- ගරු ලේකම්
- එම්.ජී.සුමතිපාල මයා — දමුණුගොල්ල ගොවි සංවිධානය- සභාපති
- බන්දුල ධනසේකර මයා — බෝපිටිය ගොවි සංවිධානය- ගරු සභාපති
- පි.බි.දිසානායක මයා — බෝපිටිය ගොවි සංවිධානය -ගරු ලේකම්

අද දින පෙ.ව 10.30 ට පමණ මෙම රැස්වීමේ කටයුතු නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. මෙහිදි පළමුව ආගම සිහි කිරීමෙන් හා ආදි ගොවි නායකයන් හා නිලධාරින් සිහි කිරීමේ විනාඩියක නිශ්ශබ්දතාවයෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගැනීමෙන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරිම

| අනු අං. | ආයතනය/ගොවි සංවිධානය | කාරණය/ගැටලුව | තීරණය |
|---|---|---|---|
| 01 | ඒකාබද්ධ ගොවි සංවිධාන සභාපති | මුරපොල ව්‍යාපාරයේ ඒකාබද්ධ ගොවි සංවිධාන සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම | තව මාස 02 ක් පමණ කන්න රැස්වීම අවසන් වනතුරු එම ධුරයේ රැදී සිටින ලෙස ඉල්ලා සිටිම |
| 02. | වාරිමාර්ග අධ්‍යක්ෂ | කොටගේපිටිය පුරාණ වෙල්යායට ජලය හිගවීම සම්බන්ධව | ඒ සම්බන්ධව සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගැනිමට යොමු කිරිම |
| 03. | ප්‍රධාන කාර්යාලය | සිරි දළදා යල් අස්වනු පූජාව 2019 ට සමගාමීව පැවැත්වෙන බක්මහේ අගසස් පූජා මංගල්‍යය සදහා අගසස් එකතු කිරිම | මේ පිළිබදව ගොවි මහතුන් දැනුවත් කිරිම |
| 04. | ප්‍රධාන කාර්යාලය | අතිරේක ආහාර බෝග ආනයනය සීමා කිරිමට සහ අපනයනය කිරිමට අවශ්‍ය ඉල්ලුම ඇති බෝග වාණිජ වශයෙන් වගා කිරිමට කඩිනමින් සැලැස්මක් පිළියෙල කර ගැනිම | මේ පිළිබදව ගොවි මහතුන් දැනුවත් කිරිම |
| 05 | වැඩසටහන් අධ්‍යක්ෂ, (PEISEIP) | PEISEIP යටතේ එක් එක් ව්‍යාපාර සදහා ක්‍රියාවලි විගණන කමිටුව ස්ථාපනය කිරිම සහ විගණන වාර්තා ඉදිරිපත් කිරිම | 1.වා.ක.අ. – H.S.P.කුමාරි මිය<br>2.වා.දෙ. – H.M.A.M.හේරත් මිය<br>3.ගො.සේ.දෙ.W.M.N.K.අරඹෙපොල මිය<br>4.කෘ. දෙ. – H.M.C.B.හේරත් මයා<br>මෙම ආයතන 4 න් ක්‍රියාවලි විගණන කමිටුව සදහා නිළධාරීන් 4 දෙනා සහ වටපදුර ගො.සං.ගරු සභාපතිගේ යෝජනාවෙන් හා ගිරාඹෙ ගො.සං. ගරු සභාපතිගේ ස්ථිරත්වයෙන් ගුරුබැද්ද ගො. සං.ගරු ලේකම් ද,<br>ගිරිඹෙ ගො.සං.ගරු සභාපතිගේ යෝජනාවෙන් හා ගිරාඹෙ ගො.සං. ගරු භාණ්ඩාගාරිකගේ ස්ථිරත්වයෙන් කොටගේපිටිය ගො.සං. ගරු සභාපති ද පත්කිරිම |

ගැටලු / යෝජනා / ප්‍රගතිය ඉදිරිපත් කිරීම

| අංකය | ආයතනය | කාරණය/තීරණය/ප්‍රගතිය |
|---|---|---|
| 01 | නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය | • PEISEIP ව්‍යාපෘතියට අදාලව මූලික දැනුවත් කිරීමේ වැඩසටහන හා මූලික දත්ත සමීක්ෂණ කටයුතු සඳහා නිළධාරීන් යොමු කිරීම පිළිබඳව ගොවිජන සේවා දෙපාර්මේන්තුවට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ස්තූති පුද කිරීම. එයට සහයෝගය දැක්වූ නිළධාරීන් සඳහා අදාල ගෙවීම් කටයුතු කිරීමට ප්‍රධාන කාර්යාලයට යවා ඇති බව<br>• මාරස්සන කලාපයේ ගොවි සංවිධානය ශක්තිමත් කර ගැනීමට ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරීගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම<br>• කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් මත වගා කිරීමෙන් වගාවේ දී වන හානි අවම කර ගත හැකි බව<br>• කෘ.ප.නි.ස. මහත්ම මහත්මීන්ගේ මෙම රැස්වීමට සහභාගිවීම පිළිබඳ ස්තූතිවන්ත කිරීම |
| 02 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | • වටපදූර ක්ෂේත්‍රයට නොපැමිණි බව ගොවීන් පවසා ඇති අතර, සති අන්තයේ සහ සතියේ දිනවල සවස් වරුවේ ක්ෂේත්‍රයට පැමිණීමට විවිධ බාධා ඇති බව<br>• ඉදිරියේ දි නියගයක් බලා පොරොත්තු විය හැකි බැවින්, ඒ සඳහා සූදානම් විය යුතු බවත්, අප්‍රේල් මස 11 දින දක්වා වැස්ස නොලැබෙන බව<br>• වතුර බෙදා දිම සඳහා ගොවි සංවිධාන ජල පාලක මහතෙක් පත් කර ඇති බැවින්, ඔහුගෙන් එම කාර්යය නිසියාකාරව ඉටුකර ගැනිම සඳහා කටයුතු කරන ලෙසත්, එසේ නොවේ නම් ජල පාලක ගාස්තු නොගෙවීමට කටයුතු කරන බවත්,<br>• වැවේ අගල් 3 දක්වා වතුර ලබා දී, දැනට අගල් 4 දක්වා වතුර ලබා දෙන බවත්,<br>• වාරිමාර්ග සේවකයන් අතිකාල දීමනාවක් නොගෙවා වැඩවල යොදවා ඇති බව |
| 03 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | • වී වගාව සඳහා කීඩෑ හානිය බලපා ඇති බව, කහඹිලියාව ප්‍රදේශයේ එම රෝගය පැතිරී ඇති බව<br>• නියං කාලගුණයත් සමග කීඩෑ හානිය වැඩිවිය හැකි බව<br>මෙම හානිය පිළිබද විමසිලිමත් විම සඳහා උදය සහ සවස් කාලයේ යොදාගත යුතු බව<br>• කීඩෑ හානිය මර්ධනය සඳහා BPMC කෘමිනාශකය යෙදිය යුතු බවත්, APLOD මගින්, කීඩෑවගේ සියලුම අවධි විනාශ වන බව<br>• මහ කන්නයේ පිදුරු ටික, වගා කරන එළවළු සඳහා වසුනක් ආකාරයෙන් තබා ගන්නා ලෙසත්, යල් කන්නයේ 80% ක් පමණ එළවළු වගා කරන අතර, ඒ සඳහා ඒවා යොදාගත හැකි බව<br>• තක්කාලි වගාව සඳහා අගල්1-2 ක් පමණ පිදුරු දැමිය යුතු බවත්, එයින් වල් මර්ධනය වන බව<br>• ජල ගැටලුවක් යල් කන්නයේ පැවතිය හැකි බව<br>• එළවළු වගාව සඳහා බිම පාත්ති යොදා සකස් කර ගත යුතු බව<br>• දැනුවත් කිරීම් ප්‍රතිඵලයක් ලෙස පසට යොදන කාබනික පොහොර ප්‍රමාණය වැඩි වී ඇති බව<br>• රසායනික පොහොර යෙදිමේ දි අක්කරයක් සඳහා ඩොලමයිට් 200-300 kg පමණ යෙදිය යුතු බවත්, |

| | | |
|---|---|---|
| | | • යල් කන්නයේ තවාන් දමන භෝග සදහා ආරක්කු නමා ආවරනයක් කල යුතු බවත්, තවාන දැමීමේ දි සැලකිය යුතු කරුණු පැහැදිලි කරන ලදි.<br>• එළවළු සදහා පැටි 100 ක් පමණ ගොවි මහතුන් වෙත ලබාදිය හැකි බව.<br>• බීජ හිගයක් ඇති බවත්, මිරිස් ඇට MICH හයිබ්‍රිඩ් ඇට 1 kg රු.1,00,000/= පමණ වන බවත්, ඒ සදහා ගොවි මහතුන් මුදල් ලබා දුනහොත් බිජ ගෙනත් දිය හැකි බවත්, එම බිජ මගින් වැඩි අස්වැන්නක් ලබාගත හැකි බව<br>• යල් කන්නය අතිරේක ආහාර භෝග වගාව සදහා යොදා ගත හැකි බව<br>• ලොකු ලූණු වගාව කල හැකි ගොවි මහතුන් සිටි නම්, ඒ සදහා නාම ලේඛනයක් ලබා දියයුතු බව<br>• කෘෂි බිජ ප්‍රතිකාරය බෝංචි වගාව සදහා කල යුතු බව [CRUSER] |
| 04 | ගොවිජන සේවා දෙපාර්තමෙන්තුව | • යල් කන්නය සදහා බීජ හා රසායනික ද්‍රව්‍ය, පොහොර සහනාධාර ලැබෙයි යන්න අනුමාන කිරිම<br>• වී වගාව නොකරන වතුර හිග කුඹුරු වල පැෂන් හෝ කෙසෙල් වගාව කල හැකි බව චක්‍රලේඛ මගින් දන්වා ඇති අතර, ඒ සදහා අවසරය ව්‍යාපාර කළමනාකරණ කමිටුවෙන් හා කන්න රැස්වීමේ දි ලබා ගත යුතු බව, ඒ සදහා අයදුම්පත් පිරවිය යුතු බවත්, එය වර්ෂ 03 දක්වා වලංගු වන බවත්, තව වර්ෂයක් සදහා දීර්ඝ කරගත හැකි බව, පසුව නැවත කුඹුරු බවට පත්කල යුතු බව<br>• අලුත් සහල් මංගල්‍ය මාර්තු 06,07 දින ජය ශ්‍රී මහා බෝ සමිදුන්ගේ අභියස පැවැත්වෙන බව, ඒ සදහා පූජා ද්‍රව්‍ය පාර්සල් කර තමා වෙත ලබා දෙනමෙන් ද පැවසිය. ඒ සදහා වගකිම අරගෙන පූජා කටයුතු සිදුකරන බව<br>• බිත්තර වී රු.1200/= බැගින් අලෙවි කරන බව, පිටින් බිත්තර වී ගෙන්වීමට සිදුවන බවත්, බිත්තර වී ගොවිපලක් කල හැකි ගොවි මහතුන් සිටි නම් පවසන මෙන් ද<br>• මුදල්මය කාර්ය සදහා ගොවි බැංකුවෙන් ණය ලබා ගැනිමට හැකි බව<br>• ගොවි කාන්තා වැඩසටහනෙන් රු.5/= බැගින් ඉතිරි කර රු.300,000/= කට වඩා ප්‍රමාණයක් ගොවි බැංකුවේ ඇති බව<br>• ස්ප්‍රේ යන්ත්‍රයක් රු.12000.00, 14000.00 ක ප්‍රමාණයකට ලබා ගත හැකි බව ඒ සදහා වසරක වගකිමක් ඇති බව |
| 05 | ප්‍රාදේශීය ලේකම් කාර්යයාලය කලාතුඔය/ කෘෂිකර්ම සංවර්ධන නිලධාරි | • පස් සාම්පල් පරික්ෂා කිරිමේ යන්ත්‍රයක් කෘෂිකර්ම උපදේශක මහතා හරහා ලබා දෙන බව<br>• තුඹ කරවිල වගාවට ආදර්ශනයක් සදහා පැල නොමිලේ ලබා දෙන බව<br>• වගා හානි සදහා විදුලි වැට හා වායු රයිපල් 50% දායකත්වය මත ලබා ගැනිමට හැකි බව |
| 06 | ප්‍රාදේශීය ලේකම් කාර්යයාලය කලාතුඔය/ඉඩම් නිලධාරි | • පැමිණ නැත |

2019 යල් කන්නයේ වගා තීරණ සාකච්ඡාවට බදුන් කර රෙබීය අයතන හා ගොවි සංවිධාන අදහස් හා යෝජනා වලින් අනතුරුව 2019 යල කන්නය සඳහා පහත සදහන් පෙර වගා තීරණ ලබා ගන්නා ලදි.

1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධිත) පනතේ 5 වගන්තියේ 6 වන උප වගන්තියට අනුව මුරපොල ඇල මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2019 යල කන්නයේ පෙර වගා රැස්වීම් තීරණ

| | | | |
|---|---|---|---|
| 01 | වගා කිරීමට යෝජිත භෝග වර්ග | වී 5%, එළවළු සහ වෙනත් ආහාර භෝග 95% | |
| 02 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය අක්කර | අක්කර 800 | |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශ | **FC-3 සිට FC-33 දක්වා** | |
| 04 | ගොවීන් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2019-04-05 | |
| 05 | ගොවීන් විසින් නියමිත වේලාවට නඩත්තු නොකරනු ලබන ඇලවල් වල ගොවි සංවිධාන විසින් නඩත්තු කර අවසන් කල යුතු දිනය | 2019-04-07 | |
| 06 | ගොවි සංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල හා බෙදුම් ඇලවල් කෙත් ඇලවල් හා දිය බස්නා ඇලවල් නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | 2019-04-07 | |
| | | පළමු පියවර | දෙවන පියවර |
| 07 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2019-04-20 | 2019-04-25 |
| 08 | බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය | 2019-04-22 | 2019-04-27 |
| 09 | වපුරා හෝ පැල සිටුවා අවසන් කල යුතු දිනය | 2019-05-05 | 2019-05-10 |
| 10 | මුර ජලය ආරම්භ කිරීමේ දිනය | ආරම්භයේ සිට | |
| 11 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2019-08-05 | 2019-08-10 |
| 12 | ට්‍රැක්ටර් හා ගවයන් යායෙන් ඉවත් කල යුතු දිනය | 2019-05-05 | 2019-05-10 |
| 13 | වගා රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | වගාව පිහිටුවීමට පෙර | |
| 14 | අස්වනු නෙලා අවසන් කල යුතු දිනය | 2019-09-05 | 2019-09-10 |
| 15 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | හානියක් වී දින 07 ක් ඇතුලත හෝ අස්වැන්න නෙලීමට පෙර | |

1994 අංක 13 දරණ සංශෝධිත වාරිමාර්ග ආඥා පනතේ 11 වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යොජිත රීති.

1.කෙත් ඇලවල් නඩත්තුව අක්කරයක් සඳහා කන්නයට රු.100.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

2. නියමිත දිනයට කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල තම කොටස නඩත්තු නොකරන ගොවින්ගෙන් අය කරන දඩය රු.1000.00 අය කිරීම.

3. පිදුරු පිලිස්සීම වෙනුවෙන් අක්කරයකට රු. 1000.00 ක දඩ මුදලක් අය කිරීම.

**4.** වෙනත් -: අක්කර 1 සඳහා කොම්පෝස්ට් කිලෝ: 2000 යෙදීම අනිවාර්ය වේ.

ඉහත සදහන් 2019 යල් කන්නය සඳහා වූ පෙරවගා රැස්වීම් තීරණ ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති මහතාගේ යෝජනාවෙන් හා කොටගේපිටිය ගොවි සංවිධානයේ සභාපති මහතාගේ ස්ථිරත්වයෙන් සභාසම්මත විය.

## ගොවි සංවිධාන නියෝජිතයින්ගේ අදහස්

නවනැලිය ගොවි සංවිධානයේ -ගරු ලේකම්

- කවම වී වගාව පුදින මට්ටමේ පවතින බැවින්, අප්‍රේල් 15 දක්වා ජලය අවශ්‍ය බව

<u>කොටගේපිටිය ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- වී වගාව සඳහා මාර්තු 20 දක්වා ජලය අවශ්‍ය බව
- ගොවි සංවිධානය තුල ක්‍රමවත් ආකායටකට වතුර බෙදා නොගන්නා බව

<u>ගිරාඹේ ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- කව වතුර මුර 02 ක් පමණ අවශ්‍ය බවත්, මාර්තු 25 දක්වා ජලය අවශ්‍ය බව

<u>වටපදුර ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- අක්.12, 15 ක් පමණ ප්‍රයෝජනයට ගත නොහැකි බවත්, ඉක්මනින් ජලය නොලැබුනහොත් යායම ප්‍රයෝජනයට ගත නොහැකි බව, ඒ සඳහා විසඳුමක් අවශ්‍ය බව, මාර්තු 25 දක්වා ජලය අවශ්‍ය බව
- වතුර අපතේ නොයවා ගොවි සංවිධානය තුල වතුර බෙදා දෙන බව

<u>මකුලයටතැන්න ගොවි සංවිධානයේ -ගරු භාණ්ඩාගාරික</u>

- කුඹුරු අක්.4,5 ක් පමණ පීදි ඇති බවත්, අප්‍රේල් 05 දක්වා වතුර අවශ්‍ය බව

<u>නීලවල ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- මාර්තු 25 දක්වා ජලය අවශ්‍ය බව
- තුඹ කරවිල වගාව කිරීමේ දී ගොවි මහතුන් වෙනුවෙන් වගකීමක් ගත යුතු බව

<u>කහඹිලියාව ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- අප්‍රේල් 01 දක්වා ජලය අවශ්‍ය බව

<u>මයිලගහයාය ගොවි සංවිධානයේ -ගරු සභාපති</u>

- මාර්තු 25 දක්වා ජලය අවශ්‍ය බව
- පස් පරික්ෂා කිරීමේ ක්‍රම වේදයක් සකස් කර දෙනමෙන් ඉල්ලා සිටීම
- පැෂන් වගාව සඳහා පොහොර සහනාධාරය ලැබෙයි ද යන්න

<u>ගොවිජන සේවා ප්‍රාදේශිය නිළධාරි</u>

- පැෂන් වගාව සඳහා පොහොර සහනාධාරය නොලැබෙන බව

<u>කෘෂිකර්ම උපදේශක</u>

- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා පස් පරික්ෂා කිරීමේ මීටරයක් ලබා ගත හැකි බව

<u>බෝපිටිය ගොවි සංවිධානයේ -ගරු සභාපතිතුමා</u>

- කව වතුර මුර 2 ක් අවශ්‍ය බවත්, මාර්තු 20 දක්වා ජලය අවශ්‍ය බවත් පැවසිය

<u>ගුරුබැද්ද ගොවි සංවිධානයේ -ගරු සභාපතිතුමා</u>

- වගාව සඳහා අමතරව වගා ළිදක් මගින් මෝටර් මාර්ගයෙන් ගොවි මහතුන් ජලය ලබා ගන්නා අතර, වගාව සඳහා කව ජලය අප්‍රේල් 5 දක්වා අවශ්‍ය බව

<u>දුමුණුගොල්ල ගොවි සංවිධානයේ -ගරු සභාපතිතුමා</u>

- පෙබරවාරි මාසය දක්වා වතුර ලබා දී ඇති බවත්, දැනට අස්වැන්න නෙලා අවසන් වී ඇති බැවින්, වී වගාව නොකරන නිසා දැනට වතුර ලබාදීම අවශ්‍ය නොවන බව,

පසුව කමිටුවෙ ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව ප.ව. 1.30 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් විය.

.........................

එම්.ජේ.ඩී.බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කලමණාකරු

එම්. ජේ. ඩී. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
මූරපොල ඇල ව්‍යාපාරය
නීලවල - කොළඹිස්ස

පිටපත්:-

1. දිස්ත්‍රික් ලේකම් - මහනුවර - කා. දැ. පි.
2. අධ්‍යක්ෂ - වාරිමාර්ග කළමනාකරණ අංශය - එම
3. ප්‍රාදේශීය ලේකම් - තලාතුඔය/දෙල්තොට - එම
4. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ-කුණ්ඩසාලේ - එම
5. සහකාර/නියෝජ්‍ය කොමසාරිස් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව- ගැටඹේ - එම
6. සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ කෘෂිකර්ම පළාත් /අන්තර් පළාත් - එම
7. වාරිමාර්ග ඉංජිනේරු/ඉංජිනේරු සහකාර - එම
8. ගො.ජ.සං.ප්‍රා. නිලධාරිවරුන් - මාරස්සන/තලාතුඔය - එම
9. කෘෂිකර්ම උපදේශක - මාරස්සන/තලාතුඔය - එම
10. සහකාර අධ්‍යක්ෂ කෘෂි රක්ෂණ මණ්ඩලය - එම
11. ගොවි සංවිධාන නියෝජිතවරුන් - එම

---

නේවාසික ව්‍යා.කළමනාකරු } 081-3808781 පැක්ස් } ඊ මේල් }
bandaradissny@gmail.com
RPM Fax E-mail